දැන් තරුණයන්ගෙ දේශපාලන අදහස I hate politics. ඒක හරි උජාරුවෙන් posh විදියට කියන්නෙ. දේශපාලන ක්‍රමය එකතැනම යි. ඒක පල් වෙනවා, කුණු ගඳ ගහනවා. මේ ධනපති ක්‍රමය මිනිසුන් කෝටි ගණන් හූරගෙන කනවා. ඒත් පාලකයො කියනව මේක තමයි ස්ථායී ක්‍රමය කියල... අපිව පාලනය කරන්නේ මැරයෝ, ස්ත්‍රී දූෂකයෝ, හොරු... ඒක හින්දම අපි අවට දැනෙන්නෙ ම කුණු ගඳ. මාධ්‍ය පාලකයන්ගෙ නිසා ඒවගෙන් හැමවෙලේ ම කියනව ඒක සුවඳයි... සුවඳයි... සුවඳයි... කියල. ගොඩක් මිනිස්සු ගඳ උහුලගෙන ඒක පිළිගන්නවා. දැන් මිනිස්සු කියන්නෙ iPhone අතේ තියාගෙන ඇවිදින සත්තු වේගෙන යන්නෙ. හැම තැනම අවුල්... හැමෝගෙම හිත්වල හිස් කමක් තියෙනවා. ඒත් හේතුව දන්නෙ නෑ... හේතුව හොයන්නෙ නෑ...

ඒත් අපට පෙනි පෙනී අපේ සන්නිවේදනය රැඳිල තියෙන Phone එක වෙනස් වුණ හැටි මතක් කරලවත් අපේ ජීවිතේ ම තීරණය කරන ධනපති සමාජ ක්‍රමය වෙනස් කරන්න අපට හිතෙන්නෙ නැත්තෙ ඇයි?...

කවුද මන්ද අපිව දේශපාලනෙන් ඈත් කරල. තාක්ෂණයට තියෙන උනන්දුව අපට දේශපාලනයට නෑ... ඒත් ඒක හරිද???...

**මධුසංක ප්‍රියදර්ශන**



# වකුගඩු රෝගය වසංගතයක් වෙයි ද?

**මි**නිසා සොබාදහමේ අපූරු නිර්මාණයකි. මේ මිනිසාගේ ශරීරය නිර්මාණය වී ඇත්තේ විවිධ සෛල, පටක, අවයව හා පද්ධති සමූහයක එකතුවෙනි. මේ අතරින් මිනිසාගේ ශරීරයේ බහිස්‍රාවීය පද්ධතිය ලෙස පද්ධතියක් ද පවතී. මිනිසාගේ ශරීරයේ ලේවල පවතින වැඩිපුර ජලය හා ලවණ ආදී බහිස්‍රාවීය ද්‍රව්‍ය ඉවත් කිරීමට මුල්වන්නේ මෙම බහිස්‍රාවීය පද්ධතිය යි. වකුගඩු දෙකක්, මුත්‍ර නාල දෙකක් හා මුත්‍රාශයකින් බහිස්‍රාවීය පද්ධතිය සමන්විත වන අතර වකුගඩුවලින් සිදුවන මුත්‍ර පෙරීමේ ක්‍රියාවලිය සාමාන්‍ය පරිදි සිදු නොවීම වකුගඩු රෝගය වශයෙන් හඳුන්වයි.

ශ්‍රී ලංකාවේ උතුරු මැද, ඌව, වයඹ හා දකුණ, ආදී විවිධ පළාත් ගණනාවක බොහෝ කතාබහට ලක්වන රෝගයකි. වකුගඩු රෝගය. මේ පිළිබඳ ව කළ පර්යේෂණ මගින් සොයාගෙන ඇත්තේ කැඩ්මියම්, ආසනික්, රසදිය ආදී බැර ලෝහ වර්ග ශරීරගත වීම ද වකුගඩු රෝගය ඇති වීමට බලපාන බවයි. උතුරු මැද පළාතේ ප්‍රදේශවල ජනතාව අතර බහුල වශයෙන් මෙම රෝගය ව්‍යාප්ත වීමට හේතුවක් වී ඇත්තේ. එම ප්‍රදේශවල

ජනතාවට පිරිසිදු පානීය ජලය නොලැබීම යි. ඔවුන්ට පානය කිරීමට සිදු වී ඇත්තේ මිශ්‍ර ජලයයි. මෙම කිවුල් ජලයේ ශරීරයට අහිතකර විෂ ද්‍රව්‍ය අන්තර්ගත ව ඇත. එබැවින් එම ප්‍රදේශවල සිටින කුඩා දරුවාගෙන් ඇරඹී වැඩිහිටි පුද්ගලයා දක්වා ම වකුගඩු රෝගීන් බිහිවීමේ අවදානම වැඩි වෙමින් පවතී.

## පර්යේෂණ මගින් සොයාගෙන ඇත්තේ කැඩ්මියම්, ආසනික්, රසදිය ආදී බැර ලෝහ වර්ග ශරීරගත වීම ද වකුගඩු රෝගය ඇති වීමට මූලිකව බලපාන බව ය.

වකුගඩු රෝගය ඇති වීමට බලපාන තවත් හේතූන් කිහිපයක් ද පවතී. ඒවා අතරින් විවිධ ආසාදන, අධික රුධිර පීඩනය හා දියවැඩියාව ආදී හේතූන් ද මුල්විය හැකි ය. නමුත් අප පරිභෝජනය කරන ජලය හා ආහාරවල ආසනික්, කැඩ්මියම් හා රසදිය වැනි බැර ලෝහ වර්ග අන්තර්ගත ව තිබීම වකුගඩු රෝගී තත්ත්වයන් ඇති වීමට මූලික හේතුවක් වී ඇත. අනුරාධපුරය (මහඔය ග්‍රාමය), පොළොන්නරුව, වව්නියාව ආදී ප්‍රදේශවල බහුල වශයෙන් වකුගඩු රෝගය ව්‍යාප්ත වීමට හේතුවක් වී ඇත්තේ ජලයේ ආසනික්, කැඩ්මියම් හා රසදිය ආදී බැර ලෝහ වර්ග මිශ්‍ර වී තිබීමයි.

උතුරු මැද පළාතේ කෘෂිකර්මාන්තය වැඩි වශයෙන් ව්‍යාප්ත ජීවනෝපායකි. කෘෂිකර්මාන්තයේ නිරතවන ජනතාව බෝග වගාවන් සාරවත් කරගැනීම උදෙසා කෘමිනාශක, වල්නාශක හා රසායනික පොහොර වර්ග යොදා ගැනීම ගනු ලබයි. එලෙස කෘෂිකර්මාන්තයට යොදා ගන්නා රසායනික ද්‍රව්‍යවල ආසනික් වැනි බැර ලෝහ වර්ග මිශ්‍රව ඇත. එබැවින් එවැනි රසායනික ද්‍රව්‍ය පසට එක් කිරීම මගින් ජලය දූෂණය වීම නොවැළැක්විය හැකි තත්ත්වයකි. කෘෂිකර්මාන්තය බහුල ව ව්‍යාප්ත වී පවතින්නා වූ ප්‍රදේශවල මෙන් ම සාමාන්‍ය වශයෙන් කෘෂිකර්මාන්තය ව්‍යාප්ත වී පවතින්නා වූ ප්‍රදේශවල ජනතාව ද බෝග වගාවන් සඳහා කෘෂිරසායනික ද්‍රව්‍ය භාවිත කරයි. එසේ දිගින් දිගට ම කෘෂිරසායනික ද්‍රව්‍ය පසට එක් කිරීමෙන් ජලයේ ආම්ලිකතාව ශීඝ්‍රයෙන් වැඩි වේ. එනිසා වර්තමානයේ දී උතුරු මැද පළාතේ ප්‍රදේශවල සුලභ වී ඇති වකුගඩු රෝගී තත්ත්වයන්, අනෙකුත් ප්‍රදේශවලට ද ව්‍යාප්ත වීම සිදුවිය නොහැක්කක් ද, යන්න අප හමුවේ ඇති තවත් ප්‍රශ්නයකි.

වකුගඩු රෝගය පැතිරී පවතින ප්‍රදේශවල පවතින ග්‍රාමීය හා ප්‍රාදේශීය රෝහල්වලින් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන්නා වූ රෝගීන්ගේ ගණන දිනෙන් දින ඉහළ යමින් පවතී. ඔවුන් වෙනුවෙන් රජයේ රෝහල්වලින් ඖෂධ වර්ග ලබා ගැනීමට සිදු වී ඇත්තේ පෞද්ගලික ඖෂධාගාරවලිනි. වකුගඩු රෝගියෙකුට ඖෂධ ලබා ගැනීම වෙනුවෙන් රු.3000ක මුදලක් ලබා දීමට තීරණය කර තිබුණ ද, එම මුදල ඔවුන්ගේ ඖෂධ වෙනුවෙන් ප්‍රමාණවත් ද? තවත් අතෙකින් බලන කල කෘෂිකර්මාන්තය ආශ්‍රයෙන් ලබා ගන්නා සුළු මුදලින් අසීරු ජීවන අරගලයක නිරත වී සිටින සාමාන්‍ය ජනතාවට ඖෂධ වෙනුවෙන් විශාල මුදලක් ගෙවීමට සිදුවීම කෙසේනම් කළ හැකි ද?

වකුගඩු රෝගයට ගොදුරු වීම හේතුවෙන් සමහර රෝගීන්ට වකුගඩු ඉවත් කිරීමට සිදුවිය හැකි ය. එවැනි රෝගීන්ට ජීවත් වීම උදෙසා රුධිරය පෙරීමේ ක්‍රියාවලිය කරගැනීමට රෝහල් කරා යොමුවීමට සිදුවේ. එවැනි අවස්ථාවක දී යන්ත්‍ර මගින් රුධිරය පෙරීමේ කටයුත්ත සිදු කිරීමට එම ප්‍රදේශවල රෝහල්වල පවතින පහසුකම් ප්‍රමාණවත් ව පවතී ද, නැතිනම් එම පහසුකම් ප්‍රවර්ධනය කළ යුත්තේ කෙසේ ද, යනාදී ප්‍රශ්න කෙරෙහි රජයේ අවධානය යොමු විය යුතු ය.

කිවුල් ජලය ඇති ප්‍රදේශවල පුද්ගලයින්ට පිරිසිදු ජලය ලබාදීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් යෙදීමටත්, ආසනික් ආදී බැර ලෝහ වර්ග අඩංගු විෂ රසායනික ද්‍රව්‍ය තහනම් කිරීම ඒවා පාලනය කිරීම හෝ එම රසායනික ද්‍රව්‍ය වෙනුවට ආසනික් වැනි විෂ රසායනික ද්‍රව්‍යයන්ගෙන් තොර වෙනත් රසායනික ද්‍රව්‍ය හඳුන්වා දීම වැනි කරුණු කෙරෙහි අපගේ අවධානය යොමු විය යුතු කාලය දැන් එළඹ තිබේ.

වකුගඩු රෝගය සම්බන්ධව වැඩි වැඩියෙන් කතාබහට ලක්වන්නේ වකුගඩු රෝගීන්ගේ ප්‍රමාණය දිනෙන් දින වැඩිවන නිසා නොවේ ද? එසේ නම් අප කළ යුත්තේ වකුගඩු රෝගය තවදුරටත් ව්‍යාප්ත වූවාට පසු ඒ වෙනුවෙන් විසඳුම් සෙවීම ද, නැත්නම් එම රෝගය ඇති වීමට බලපාන්නා වූ හේතු සාධක නැති කිරීමට උත්සාහ දැරීම ද, යන්න මදක් සිතා බැලිය යුතු ප්‍රශ්නයකි.

**එන්. සී. යෝගානි**